## ශ්‍රී ලංකාවේ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ දේශීය සේවකයෙකුට එරෙහි නඩුවේදී

## නිසි පටිපාටියක් නොමැති වීම විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) විවේචනය කරයි

පුවත්පත් නිවේදනය, 16.12.2019

කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ සේවිකාවක් බොරු ප්‍රකාශ කළ බවට චෝදනා කරමින් අද රඳවාගෙන තිබේ. විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) මේ පිළිබඳව සැලකිලිමත් වන අතර, මේ සම්බන්ධයෙන් වැඩිදුර කටයුතු කිරීමේදී ජාතික නීතිය හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මෙම සේවකයාගේ පුද්ගලික අයිතිවාසිකම් වඩා හොඳින් ආරක්ෂා වන බව සහතික කරන ලෙස ශ්‍රී ලංකා අධිකරණ බලධාරීන්ගෙන් ඉල්ලා සිටී. විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) සහ කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය සේවා යෝජකයෙකු ලෙස ඔවුන්ගේ වගකීම් දිගටම ඉටු කරන අතර අදාළ කාර්ය මණ්ඩල සාමාජිකාවට සහාය වීම සඳහා ඔවුන්ට හැකි සෑම ආකාරයකින්ම කටයුතු කරනු ඇත.

තානාපති කාර්යාලයට අදාළ තොරතුරු හෙළි කරන ලෙස බල කරමින් ඇය කොළඹදී පැහැර ගත් බව 2019 නොවැම්බර් 25 වන දින ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලයේ දේශීය සේවිකාවක් වාර්තා කළාය. මේ පිළිබඳව ගත් සියලු ක්‍රියාමාර්ගවලදී වින්දිතයා සහ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය ශ්‍රී ලංකා බලධාරීන් සමඟ පූර්ණ සහයෝගයෙන් කටයුතු කළහ. නියමිත ක්‍රියාදාමය අනුගමනය කරන ලෙස විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) නැවත නැවතත් ඉල්ලා ඇත. විශේෂයෙන්ම දුර්වල සෞඛ්‍ය තත්වයක පසුවූ සේවිකාවගෙන් දින 3 ක් පුරා පැය 30 ක් ප්‍රශ්න කිරීම හා විමර්ශන අවසන් වීමට පෙර ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇයගේ විස්තරය පිළිබඳව ප්‍රශ්න කිරීම විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) විවේචනය කර ඇත.

මෙම සේවකයා අත්අඩංගුවට ගැනීමෙන් පසු, ශ්‍රී ලංකා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් ජාතික නීතිය හා ජාත්‍යන්තර අධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහ සේවකයාගේ අයිතිවාසිකම් වඩා හොඳින් ආරක්ෂා කිරීම සහතික කිරීම විදේශ

කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) අපේක්ෂා කරයි. සේවා යෝජකයෙකු ලෙස, විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) ශ්‍රී ලංකා බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්නේ අදාළ නීතිය යටතේ ඔවුන්ගේ යුතුකම් ඉටු කරන ලෙසත් සේවකයාගේ දුර්වල සෞඛ්‍ය තත්වය පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වන ලෙසත් ය. ස්විට්සර්ලන්තය අවධාරණය කරන්නේ බොහෝ අවධානයට ලක්වී ඇති මෙම සිද්ධියේ දී නීතියේ ආධිපත්‍යය පිළිගන්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ කීර්තිය අවදානමට ලක්ව ඇති බවයි. විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) සහ කොළඹ ස්විට්සර්ලන්ත තානාපති කාර්යාලය ඔවුන්ගේ සේවකයාට හැකි තාක් දුරට සහයෝගය දක්වනු ඇත.

ආරක්ෂාවට අදාළ මෙම සිද්ධිය විසඳීම සඳහා පොදු හා ඵලදායී මාර්ගයක් අපේක්ෂා කරන බව විදේශ කටයුතු පිළිබඳ ෆෙඩරල් දෙපාර්තමේන්තුව (FDFA) ශ්‍රී ලංකා බලධාරීන්ට නැවත අවධාරණය කර තිබේ. කොළඹ ස්විට්සර්ලන්ත තානාපතිවරයා 2019 දෙසැම්බර් 16 වන දින ශ්‍රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ මුහුණට මුහුණ හමුවූ අවස්ථාවේ මෙය නැවත අවධාරණය කරන ලදී.